

# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි

මා 2008 සැප්තැම්බරයේ දී මේ "සිනුවර හසුන" කොලම ලියන්නට පටන් ගත්තේ කවි බසින් "සිනුවර" යැයි හැඳින්වෙන සිඩ්නි නුවර තතු විස්තර කිරීමේ මූලික අභිප්‍රාය ඇතුවය. ඒ විස්තර සමගම මගේ මතිමතාන්තර ද අඩු නැතුව ඇද බෑවෙමි. මෙවර සිනුවර හසුන ලිපිය නම් සිනුවරට කෙලින්ම සම්බන්ධයක් නැතුවා සේ ඔබට හැඟෙතොත් එය වැරදි නොවේ.

ලොව අන් සියළුම දේ සේම සත්‍යය යන්නද සාපේක්ෂ සංකල්පයකි. අප යම් කිසි දෙයක් සත්‍යයක් යැයි වටහා ගන්නේ අපේ සිත තුල ගොඩ නැගී ඇති එක්තරා රාමුවකට අනුකූලවය. එම රාමුව වෙනස් කළ විට, එය මත පදනම් වුනු අපේ සත්‍යය තවදුරටත් සත්‍යයක් ම නොවීමට ඉඩ තිබේ.

ඒ කෙස් පැලෙන තර්කයේ නිරවද්‍යතාවය කෙසේ වෙතත්, යම් කිසි දෙයක් ගැන අප දරණ මතය සෑම විටකම නිවැරදි යැයි සිතා සිටීම නම් විහිළුවකි. නමුත් අප සමහරුන් අම්මා මුත්තා කිව්වත් තම මතය වැරදි යැයි පිළි නොගනිති. අද මා ඔබට කියන්නට යන්නේ මා ලද එවන් අත්දැකීම් දෙකක් ගැනයි.

මින් පළමුවැන්න සිදුවූයේ අදින් දශක දෙක හමාරකටත් එහා 1982 වසරේ දී ය. මේ කාලයේ දී මම මසකට වරක්, දෙවරක් කොළඹ ට නුදුරු අප නිවස හා පේරාදෙනිය අතර දුම්රියෙන් යෑමට පුරුදු වී සිටියෙමි. සිකුරාද සවස තුනට පමණ පේරාදෙනිය හන්දිය දුම්රිය ස්ථානයෙන් දුම්රියට නැග වේයන්ගොඩින් බැසීමත්, ඉරිද පස්වරුවේ ආපසු ගමන් කිරීමත් මට හොඳහැටි හුරුවී තිබුනි.

නුවර සහ පේරාදෙනිය හන්දිය අතර තවත් එක් දුම්රිය ස්ථානයක් තිබුනි. ඒ සරසවි උයන යි. මා මේ දුම්රිය ස්ථානය පාවිච්චි කර ඇත්තේ මුළු ජීවිත කාලයටම එකම එක දිනක පමණි.

දිනක් කලින් කතා කරගත් පරිදි මගේ මිතුරෙකු මහනුවර සිට කොළඹ බලා යෑමට සවස දුම්රියේ පැමිණි අතර, දුම්රිය පේරාදෙනිය හන්දිය දුම්රිය ස්ථානයට ලඟාවෙද්දී, කවුළුවෙන් එබී බලමින් දුර සිටම මා සොයමින් සිටි ඔහු දැක මම එම මැදිරියටම ගොඩ වුනෙමි. මේ මා මිතුරා ජීවිතයේ මුල් වතාවට මහනුවර සිට දුම්රියෙන් කොලඹ යන අවස්ථාවයි. කඩුග න්නාව කන්ද බහින දුම්රියේ අප අල්ලාප සල්ලාපයේ යෙදෙමින් සිටියදී කුමක් හෝ නිසා සරසවි උයන දුම්රිය ස්ථානය ගැන සඳහන් විය. මා එහිදී පවසා සිටියේ, මා එහි ගොස් ඇත්තේ ජීවිතයටම එකම දිනක් පමණක් බවයි. මා මිතුරා එය නොපිළිගත්තේය.

"බොරු කියන්න එපා බං. උඹ අදත් නැග්ගේ සරසවි උයන ස්ටේෂන් එකෙන්නේ! මම හොඳටම දැක්කා, ඇයි මං නුවර ඉඳන්ම ජනේලෙන් බලා ගෙනනේ ආවේ!" ඔහු කියා සිටියේය.

පසුගිය වසරක පමණ කාලය තුල මා සෑමදම දුම්රියට ගොඩවුනේ පේරාදෙනිය හන්දිය නැවතුමෙන් ම බව මම නැවත නැවත කීවද එය පිළිගත්තේ මා මිතුරා නම් නොවේ. මා දුම්රියට නැග්ගේ සරසවි උයනෙන් ම ය යන තම මතය ඔහු වෙනස් නොකළේය.

අවසානයේ දී මා ඔහුට දිනුම දෙමින් "මචං, උඹ කියන එක මං පිළිගන්නම්! උඹනේ මට වඩා දන්නේ මං කෝච්චියට නැග්ග තැන!" යනුවෙන් ප්‍රකාශ කළෙමි. එවිට කට වැසුනද මා මිතුරා තම මතය වෙනස් කළේ යැයි මම අද ද නොසිතමි.

මා ඔබට කියන දෙවන සිද්ධිය වූයේ වැඩි ඈතක නොව 2008 වසරේ ජනවාරියේ දී ය. නිවාඩුවට ලංකාවට ගොස් සිටි අප දුරකතනයෙන් ලද ආරාධනයක් අනුව මා බිරිඳ ගේ පාසැල් මිතුරියක ගේ නිවසට රාත්‍රී ආහාරය සඳහා යෑමට සිදුවිය. "අපේ ගෙදරට හැරෙන පාර තියෙන්නේ තලවතුගොඩ හන්දියේ ඉඳලා කොට්ටාව දිහාට කිලෝමීටරයක් වත් යන්න ඉස්සෙල්ලා!" යි අප මිතුරිය කියා සිටියාය. "හන්දියේ ඉඳලා ටික දුරක් යන කොට කුඹුරක් හම්බ වෙනවා, කුඹුර ඉවර වුනු තැනම වම් අත පැත්තේ තියෙන ගුරු පාරේ ආවාම වංගුව ලඟ තාප්පේ අපේ ගෙදර නොම්මරේ ගහලා තියෙනවා" ඈ වැඩි දුරටත් කීවාය. මම වැඩි හොඳට සම්පූර්ණ ලිපිනය ඉල්ලා ගතිමි.

එද රාත්‍රියේ අප තලවතුගොඩ පසුකරන විටම මම රථයේ සංචාර දුර පෙන්වන දර්ශකය ශූන්‍යය බවට පෙරලීමි. රථය විනාඩියකින් පමණ කිලෝමීටරක් පසු කළේය. ගුරු පාරක් තබා, කුඹුරක් පෙනෙන තෙක් මානයේ නැත. මම රථ ය පාර අයිනේ නතර කර ජංගම දුරකතනයෙන් මිතුරිය ඇමතීමි. "අපි හන්දියේ ඉඳලා දැන් කිලෝමීටර් එකක් පහු කලා, හැබැයි, කුඹුරක් නම් ලඟක නෑ" මම කීවෙමි.

කිලෝමීටරයකට වඩා කොට්ටාව දෙසට ගියානම් අප ඇයගේ නිවස පසුකර ගොස් ඇති බව මිතුරියගේ නිගමනය විය. රාත්‍රියේ අඳුර නිසා අපට කුඹුරු යාය නොපෙනෙන්නට ඇත. ඇගේ උපදෙස් අනුව, අපි ආපසු හැරී සෝදිසියෙන් අවට බලමින් තලවතුගොඩ දෙසට ගමන් කළෙමු. කුඹුරක් හෝ ගුරු පාරක් නොතිබුනි.

නැවත තලවතුගොඩ හන්දියට පැමිණි පසු මට අප කර ඇති වරද වැටහිණ. අප කිලෝමීටරය මැන ඇත්තේ වැරදි හන්දියේ සිට විය යුතුය. මම එක එල්ලේ බත්තරමුල්ල හන්දිය දෙසට රථය ගෙන ගියෙමි. එතැන් සිට කිලෝමීටරයක් කොට්ටාව දෙසට ආවෙමි. නමුත් කුඹුරක් අසල පිහිටි ගුරු පාරක් නැත. නැවතත් මිතුරිය ඇමතීමි. ඇය කියා සිටියේ කිලෝමීටරක් පැමිණිය යුත්තේ තලවතුගොඩ හන්දියේ ම සිට බවයි. මේ ඇය උදේ හවා දිනපතා තම මෝටර් රථයෙන් යනෙන මාර්ගයයි.

පසුව ඇගේ නිවසේ ලිපිනය මග අසල පිහිටි කඩයකට පෙන්නා තවත් පැහැදිලි කරගත් අපි තවත් පැය භාගයක් පමණ රස්තියාදුවීමෙන් පසු කුඹුර අසල පිහිටි ගුරු පාර සොයා ගතිමි. එය පිහිටියේ මා මෝටර් රථ දර්ශකයෙන් නීර්ණය කළ පරිදි, තලවතුගොඩ හන්දියේ සිට කිලෝමීටර් දෙකයි දශම තුනක් පමණ කොට්ටාව දෙසටය!

අප ඇගේ නිවසට ගොඩ වූ වහාම මා මිතුරියට මේ නිවැරදි දුර ප්‍රමාණය දැන්වීමි. ඇය තමන් කළ වරද පිළි නොගත්තාය. "අනේ මං උදේ හවස කාරෙකේ යනවනේ, තලවතුගොඩ හංදියට කොහේද එච්චර දුරක්?" ඈ කීවාය.

අද ද ඇය තම නිවසට තිබෙන්නේ හන්දියේ සිට කිලෝමීටරයක දුරින් යැයි ඇය සිතාගෙන ඇතුවාට සැක නැත. තම මතය කෙසේ වෙතත් එම මතයේ ම එල්බී, එද රාත්‍රියේ අප ආපසු හරවා යැවීම ගැන නම් මගේ සිත තුල ඇත්තේ දැඩි අමනාපයකි.

මෙලෙස තම මතයම හරි මතය බව සිතමින් අනුන් පෙළන්නන් සිටින්නේ ලංකාවේ පමණක් නොවේ. "සිනුවර" ද, "මෙනුවර" ද ඇතුළු මේ "දකුණු කුරු දිවයින" අන් ඕනැම නුවරක ද මෙවැන්නෝ එමට සිටිති.

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල
<sinuwara.arachchila@gmail.com>



# පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

"වන සිව්පාවුන් වැනි මිනිසුන් මැද

දෙව් දේවතාවන් වැනි මිනිසුන් ඇත....."

චන්ද්‍රලේඛා පෙරේරා ගායන ශිල්පිනියගෙ කටහඬ සෙමින් මැකී ගියා. මාලනී ජයසිංහ මැතිණියගේ දේහය තැන්පත් කරලා තිබුණ පීඨිකාව සෙමින් පහත් වෙලා නොපෙනී ගියා.

පන්හිඳයි, පින්සලයි බලාගත්ත අතේ ඔහේ



## සදා රැඳේවා !

බලා උන්නා.

"හරි ලොකු හිස් තැනක් නේද? " පන්ට ඉබේටම කියවුණා.

"ඔව් වහන්න බැරි තරම් ලොකු ...." පින්ගේ උගුර හිරවෙලා වචන පැටළුනා.

"මේ දැක්කද මාලනී අක්කා ලෙඩ ඇඳේ ඉඳන් සන්නස කියවන පින්තූරේ? " ශ්‍රීනාත් මද්දුමගේ කොහේදෝ ඉඳලා එතෙන්ට ආවා. ශ්‍රීනාත්ගේ ජංගම දුරකථනයට ශ්‍යාමන් ජයසිංහ මහත්තයා එවපු පින්තූරය දැකලා පන්ට මහා හයියෙන් ඇඬුනා.

"අන්තිම මොහොත වෙනකල් හොඳ සිහියෙනුයි ඉඳලා තියෙන්නේ " පින් කිව්වා. පහු ගිය සන්නස පත්තරේ මේ ලිපිය වෙන්වුනේ මාලනී අක්කා වෙනුවෙන්. ශ්‍රීනාත්ගේ ලිපියකුත් පළවුණා.

"මරණ මංචකයේදී පවා මාලනිය අපහට පාඩම් කියා දුන්නා. වේදිකාව පිටුපසින් සිටිමින් අන් අයව මෙහෙයවූ ආකාරයෙන්ම ස්ප්‍රිංවේල් පොදු සුසාන භූමියේ බොයිඩ් චැපල්හි තැන්පත් කර තිබුණ මල් අතරින් සිට ඇය සිය අවසන් කටයුතු මෙහෙය වූ ලෙසිනි අපහට හැඟුනේ......" පන් ගෙදර ආව ගමන් ලියන්න පටන් ගත්තා.

කලට වෙලාවට අවසන් කටයුතු අරඹන්නට, නිමවන්නට සංවිධාන කටයුතු කළ SLATS සංවිධානය මෙහෙයවූයේ ඇයයි.

තාරුණ්‍යයට ඉඩක් ලබා දීමට ඔවුන්ව පෙළඹවූයේ මාලනී චින්තනයයි. මා පිය – දූ දරු සබඳතා දිනෙන් දින වියැකෙන අප සමාජයේ මිත්තණියක ලෙසින් සිය මුණුපුරු මිණිපිරියන් සමඟින් පවා සබඳතා නංවාලීම පිළිබඳව පාඩම් කියා දුන්නේ ඇයගේ ලෙන්ගතුකමයි.

විද්‍යා විෂයයන් හදාරා ඉගැන්වීම් කළ මාලනී ජයසිංහ ගුරුතුමිය මව් බිමේ ගුවන් විදුලි හා රූපවාහිනී විද්‍යා අධ්‍යාපනික වැඩසටහන් මෙහෙයවීමෙහි ලා පුරෝගාමී වූවාය. එවැන්නියකගෙන් ශ්‍රී ලාංකේය කලාවට ද සිදු වූ සේවාව විශේෂයෙන් සිහිපත් කළ යුතුයි.

ගැලපෙන දේ සඳහා පමණක් ඒ ඒ ගැලපෙන පුද්ගලයින් යොමු කරවීම, නැගෙන්නන්ට අත හිත දීම, සෑම පුද්ගලයෙකුගේම ස්වාධීනත්වය ඇගයීම, නිහතමානිත්වය හා කැපී පෙනීමට උත්සාහ නොදැරීම, අන් සිත් නොතලා පැවසිය යුතු දේ සෘජුව පැවසීම මාලිනියගේ චරිතයේ අප දුටු විශේෂ ලක්‍ෂණ වීය. ඒ ඒ පුද්ගලයින්ගේ කුසලතා හඳුනා ගැනීමෙහි ලා ඈ සතුවූ සහජ "ඉව" පිළිබඳවද මෙහිලා සටහන් තබනු වටියි.

මාලනී ජයසිංහ මැතිණිය වෙනුවෙන් කළ හැකිවූ යුතුකම් බොහොමයක් ඉටු විණැයි අපි සිතමු. ඇය රෝගාතුර වූ අවස්ථාවේ පටන් ඒ වෙනුවෙන් උනන්දු වූවන් බොහෝයි. අවසන් ගෞරව දැක්වීමට රැස්වූ මහා ජනකායද ඊට නිදසුන්. පවුලේ උදවිය, හිතවතුන් හා සංවිධාන මුල් වී ඉදිරියේදී ඇය වෙනුවෙන් කළ යුතුව ඇති පුණ්‍යකර්මයන්ද නොපිරිහෙලා ඉටු කෙරෙනු ඇත. එසේ වුවද ඇය වෙනුවෙන් අපහට කල හැකි වටිනාම යුතුකම වන්නේ ඇයගේ චින්තනය ඉදිරියට ගෙන යාමයි. ඇයගෙන් තොරව එය ඉටු කිරීම සුළු පටු අභියෝගයක් නොවේ. එහෙත් ඇයගේ ගුණ සුවඳ රැඳි මතකය ඒ අභියෝග ය යම් තරමින් හෝ ජය ගැනීමෙහි ලා කටයුතු කරන්නන් අතරේ සදා රැඳේවා ! ය යන්න අප-ගේ ඒකායන ප්‍රාර්ථනයයි.

**මාලනියේ.......**
**සඳ සඳ ම ය ඔබ සඳ සේ නොවේදෝ ?**
**සඳ නැති සඳ අමාවකම ලබාදෝ ?**
**හිරු හිරු ම ය ඔබ හිරු සේ නොවේදෝ ?**
**හිරු නැති සඳ අඳුරෙම ලොව ගිලේදෝ ?**
**වස්සානේ අග පෑයු හිරු වූයේ**
**හෙළ පොරණේ තෙද මහිමෙන් හැඩ වූයේ**
**ගිම්හානේ රෑ පෑයූ සඳ වූයේ**
**මව් දෙරණේ ගුණ සිසිලෙන් නැහැවූයේ**
**මෑණියනේ දරුවන් මුණුපුරන් තැනූ**
**මෑණියනේ සිසුවන් සිසුවියන් තැනූ**
**මෑණියනේ සුරුවන් නිමැවුමින් තැනූ**
**මෑණියනේ සැමවුන් සැම අතින් දිනූ**
**භූමිකාව රඟමින් එළි කළා යසයි**
**වේදිකාව රසයෙන් නැහැවුවා සැබැයි**
**ජීවිකාව සේ කැප වූ මෙහෙය අගෙයි**
**ශාලිකාව ඔබ නැති දා අඳුරු වුණයි**
**මාලනියේ රූ බර හෙළ ලාලනියේ**
**මාලනියේ නෑ ඔබ වියපත් වූයේ**
**මාලනියේ ස්නේහයෙ සුකුමාලනියේ**
**මාලනියේ නෑ ඔබ-අප වෙන් වූයේ**
**නෑ සියයන් අතරේ යළි ඉපදේවා !**
**සිසු දරුවන් අතරේ ගුණ සැපිරේවා !**
**හිත මිතුරන් අතරේ මඟ පෑදේවා !**
**සිත නිවමින් සසරේ නිවනට යේවා !**

සිසිර දිසානායක